සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/LH/07/Model Village
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2024.03.13

**සමෘද්ධි චක්‍රලේඛ අංක 2024/06**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම මූලස්ථාන, බැංකු සමිති, ව්‍යාපෘති, ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්,
සියළුම සංවර්ධන නිළධාරින්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිළධාරින් වෙත.

**නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One Village- One Product) වැඩසටහන හා විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම -2024**

## 01.හැඳින්වීම

සමෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ සහනාධාර ලබාදීමේ ක්‍රියාවලිය සමාජ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය යටතට පත්වීමත් සමග අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ මූලික වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ඇත. ඒ අනුව අස්වැසුම සුභසාධන ප්‍රතිලාභීන් ලෙස හඳුනාගත් පවුල් ලක්ෂ 12 ක් වසර 03 ක් තුළ සවිබලගැන්වීමට යෝජිත අතර, ඒ අතරින් පවුල් ලක්ෂ 03 ක් 2024 වර්ෂයේදී සවිබලගැන්වීමට සැලසුම් කර ඇත.

සවිබලගැන්වීමේ කාර්යය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2016 වර්ෂයේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනෙන් ලද අත්දැකීම්ද පාදක කරගනිමින් 2024 වර්ෂයේදීත් මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය. මෙහිදී සමජාතිය නිෂ්පාදනය කරනු ලබන හෝ සිදුකිරීමට අපේක්ෂිත පවුල් කණ්ඩායම්ගත කරමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට නියමිත අතර, **එක් ගමක්- එක් නිෂ්පාදනයක් (One Village- One Product)** සංකල්පය යොදාගැනීමට නියමිතය.

මෙම ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියේ දී ගම්මානය තුල එක් නිෂ්පාදනයක් ප්‍රවර්ධනය කරන අතර, විභවතාවයක් සහිත අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ද ඉඩ ප්‍රස්ථාව පවති.

දිවයින පුරා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ගම්මාන 122 ක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, දිස්ත්‍රික්කයේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව පාදක කරගනිමින් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරනු ලබන ගම්මාන සංඛ්‍යාව තීරණය කර ඇත. මෙහිදී ගම්මානයේ අදාල ව්‍යාපෘතිය සඳහා

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

Tel- / Fax - / E-mail-
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General: 011-2872202, 011-2889002, dgsamurdhi@gmail.com
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment): 011-2873799, 011-2873996, diradmin@samurdhi.gov.lk, Hot Line :0112-889007
ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant: 011-2869742, 011-2869742, finance@samurdhi.gov.lk
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance): 011-2889003, 011-2887469, Hot Line:0112-885582
කාර්යාලය / அலுவலகம் / Office: 0112872202, Hot Line: 011- 28

යාබද ගම්මාන වල සිටින විභවතාවයක් සහිත ප්‍රතිලාභීන් ද සම්බන්ධ කර **පොකුරු ගම්මාන (Cluster Village)** ලෙස සංවර්ධනය කිරීමට ද නියමිතය.

සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහනට අමතරව, ව්‍යාපෘති සඳහා පවතින විභවතාවය සැලකිල්ලට ගෙන **ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකු ආධාර වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා නොගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි, විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති** ක්‍රියාත්මක කිරීමටද නියමිතය.

**02.අරමුණු**

1. ව්‍යාපෘතිලාභීන්ගේ මාසික ශුද්ධ ආදායම අවම වශයෙන් රු: 30,000.00 දක්වා ඉහළ නැංවීම.
2. ගම්මානයේ පවතින සම්පත් සඳහා නිසි වෙළඳපොල වටිනාකමක් ලබාගැනීම.
3. අපනයන අභිමුඛ හා ආනයන ආදේශක භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම.
4. වගා නොකළ ඉඩම් හා පවතින සම්පත් කෘෂි හා සත්ත්ව පාලන ව්‍යාපෘති සඳහා යොදාගැනීම.
5. කෘෂි, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්ත හා සේවා යන ක්ෂේත්‍රයන්හී ව්‍යාපෘතීන් දිරිමත් කර, එහි අගය එකතු කිරීම තුළින් වැඩි වටිනාකමක් ලබාදීම.
6. නිෂ්පාදන සඳහා පවතින දේශීය හා විදේශීය අලෙවි අවස්ථා පුළුල් කිරීම සඳහා ඩිජිටල් වේදිකාව (Digital Platform) යොදාගැනීම.

**03.ගම්මාන හඳුනාගැනීමේ නිර්ණායක**

1. හඳුනාගනු ලබන ගම්මානයේ නිෂ්පාදන/ කර්මාන්ත හෝ සේවාව සඳහා විභවතාවයක් පැවතිය යුතු අතර, ඒවා සමජාතීය විය යුතුය.
2. අපනයන විභවයක් හෝ ආනයන ආදේශකයක් ලෙස සැලකිය හැකි නිෂ්පාදනයක්/ කර්මාන්තයක්/ සේවාවක් පවතින ගම්මානයක් හෝ වෙළඳපොල ඉල්ලුමක් සහිත පාරම්පරික නිෂ්පාදන පවතින ගම්මාන පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය.
3. ව්‍යාපෘතිය මගින් කෙටිකාලයක් තුලදී ප්‍රතිලාභ ලබාගැනීමට මෙන්ම, අදාල ව්‍යාපෘතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමට හැකියාවක් තිබිය යුතු අතර, එය දිගුකාලීන තිරසර ආදායම් මාර්ගයක් ද විය යුතුය.
4. නිෂ්පාදන ආදර්ශ ගම්මානය ආරම්භ කිරීමෙන් පසුව, ව්‍යාපෘතිලාභීන්ට තම නිෂ්පාදන කටයුතු ස්වාධීනව අඛණ්ඩව කරගෙන යාහැකි ව්‍යාපෘති විය යුතුය.

**04.ප්‍රතිලාභීන් හඳුනාගැනීම**

1. **සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනේදී සහ තනි පුද්ගල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි වැඩසටහන යටතේ සහනාධාර ලැබූ ප්‍රතිලාභියෙකු වීම අනිවාර්යය වන අතර, දැනට අස්වැසුම ප්‍රතිලාභියෙකු වීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.**
2. 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලබන වෙනත් කිසිඳු වැඩසටහනක් යටතේ ප්‍රතිලාභ නොලබන පවුලක් විය යුතුය.
3. දැනටමත් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින හෝ ඒ සඳහා විභවතාවයක් සහිත පුද්ගලයින් විය යුතුය.
4. විභවතාවයක් සහිත කාන්තා මූලික පවුල් හඳුනාගැනීම කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

5. සියළුම ව්‍යාපෘතිලාභීන් හෝ පවුලේ සාමාජිකයෙකු ප්‍රජා මූල සංවිධානයේ සාමාජිකයෙක් විය යුතුය.

**05.ක්‍රියාත්මක ක්‍රමවේදය**

I. පවුල් සංවර්ධන සැලැස්ම මගින් ව්‍යාපෘතිලාභීන් සඳහා සුදුසු ජීවනෝපාය මාර්ගය හඳුනාගැනීම සිදු කළ යුතුය.

II. සමජාතීය නිෂ්පාදනය සිදු කරනු ලබන පවුල් ඒකරාශී කරගත යුතුය.

III. ව්‍යාපෘතිය සඳහා ඇමුණුම් අංක 01 හී, අංක 10 යටතේ ඇමුණුම් අංක 02 හී තොරතුරු ද ඇතුළත් කර ව්‍යාපෘති වාර්තාවක් සකස් කර අදාළ නිර්දේශයන් සහිතව ලබාදිය යුතුය.

IV. මෙම ව්‍යාපෘති වාර්තාවේ සඳහන් ක්ෂේත්‍රයට අදාල රේඛීය ආයතන නිලධාරීන්ගේ උපදෙස් හා තාක්ෂණික/ සහාය සේවා නිලධාරීන්ගේ නිර්දේශය ලබාගැනීම අනිවාර්යය වේ.

V. මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලින් වන අතර, සෑම ව්‍යාපෘතියක්ම සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය වෙත වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර අනුමත කරගත යුතුවේ. එබැවින් අදාල ආකෘතියට අනුව සියළු තොරතුරු අන්තර්ගතව, නිවැරදි ව්‍යාපෘති යෝජනා ලබාදීම අත්‍යවශ්‍යවේ.

VI. කර්මාන්ත සේවා කාර්යාංශය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කරන ලද වෙළඳපොල විශ්ලේෂණය තුලින් මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා සුදුසු ව්‍යාපෘති හඳුනාගෙන ඇත. ආදර්ශ ගම්මාන සඳහා සුදුසු නිෂ්පාදන ව්‍යාපෘති හඳුනාගැනීමේදී මේ පිළිබඳව සැලකිල්ලක් දැක්වීම අත්‍යවශ්‍යවේ.

VII. විසිරුණු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදීද වෙළඳපොල විශ්ලේෂණය තුලින් හඳුනාගත් ව්‍යාපෘති දත්ත උපයෝගී කරගත යුතු අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල උපරිම ව්‍යාපෘති වර්ග 05 කට සීමා විය යුතු අතර, දිස්ත්‍රික්කයක් තුල ව්‍යාපෘති වර්ග 08 කට සීමා විය යුතුය.

VIII. රක්ෂණාවරණ හිමිකම් ලබාගත හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතිය රක්ෂණය කිරීම අනිවාර්යයවේ.

**06. විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනට අමතරව, විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහාද සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලින් ප්‍රතිපාදන වෙන්කර ඇත.

ඉහත සඳහන් පරිදිම එම පවුල් සඳහා ද පවුල් සංවර්ධන සැලැස්ම සකස් කර සුදුසු ව්‍යාපෘති හඳුනාගැනීම අත්‍යවශ්‍ය වන අතර, වෙළඳපොල විශ්ලේෂණය තුලින් හඳුනාගත් ව්‍යාපෘති පිළිබඳවද අවධානය යොමු කිරීම වැදගත්වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි ආදර්ශ ගම්මාන සඳහා ලබාදී ඇති උපදෙස් හා මගපෙන්වීම් එපරිද්දෙන්ම උපයෝගී කරගත යුතු අතර, ඇමුණුම් අංක 03 හී පරිදි ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතුය.

නිෂ්පාදන ආදර්ශ ගම්මානය සහ විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති සඳහා සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාවන් ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ නිර්දේශය සහිතව jeevonopaya@gmail.com/ samurdhimarketing@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ 2024.05.06 දිනට පෙර ලබාදිය යුතුවේ.

**07.ප්‍රතිපාදන වෙන් කිරීම**

I තෝරා ගනු ලබන එක් නව ගම්මානයක් සඳහා හඳුනාගනු ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන අනුමත කරනු ලැබේ.

II ගම්මානයක අවම වශයෙන් ව්‍යාපෘතිලාභීන් 25 දෙනෙකුවත් සිටිය යුතු අතර, එක් ව්‍යාපෘති ලාභියකු වෙනුවෙන් උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රු.100,000.00 ක් වන අතර, විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති වලදී ද උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රු.100,000.00 කි.

III ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන අනුමත කිරීමේදී ඒ ඒ දිස්ත්‍රික්ක වෙතින් ලැබෙන අනුපිළිවෙල මත සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කරනු ඇත.

IV ව්‍යාපෘතිය සඳහා උපරිම දෙපාර්තමේන්තු දායකත්වය 50% වන අතර, **කිසිදු අවස්ථාවකදී ව්‍යාපෘතිලාභියා වෙත මුදල් ආධාර ලබා නොදිය යුතුය.** අවම ප්‍රතිලාභී මූල්‍ය දායකත්වය 50% ක් විය යුතුය.

V ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තු දායකත්වය සහ ප්‍රතිලාභී දායකත්වය ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී සමෘද්ධි ප්‍රජා මූල බැංකුව හෝ වෙනත් මූල්‍ය ආයතනයක් මගින් ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව පවතී.

VI යම් නිෂ්පාදනයක් වැඩි දියුණු කිරීමට ප්‍රාග්ධන භාණ්ඩ වල අවශ්‍යතාවයන් ඇති විට ප්‍රතිලාභියාගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රාග්ධන උපකරණ ලබා දිම අත්‍යවශ්‍ය වේ.

VII සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනේදී, නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාලව යම් කණ්ඩායමක් සඳහා අත්‍යවශ්‍ය පොදු යන්ත්‍ර සූත්‍ර වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ප්‍රතිපාදන වෙන් කල හැකිය.

VIII සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරනු ලබන සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන සහ විසිරුණු ව්‍යාපෘති (තනි පුද්ගල) ව්‍යාපෘති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන අංශය හා අලෙවි සංවර්ධන අංශය ඒකාබද්ධව 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ මෙම අංශ දෙක මගින් සම්බන්ධීකරණය කරනු ලබන දිස්ත්‍රික්ක ඇමුණුම් අංක 04 න් දක්වා ඇත.

IX රජයේ ප්‍රතිපාදන මගින් ලබාදෙන යෙදවුම් තම නිෂ්පාදන කාර්යයන් සඳහා පමණක්ම යොදාගන්නා බවට අදාල ව්‍යාපෘතිලාභියා, තම කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් සමඟ ඇමුණුම් අංක 05 හී පරිදි ගිවිසුම්ගත විය යුතුය.

X ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජය විසින් අනුමත ප්‍රසම්පාදන, මුදල් රෙගුලාසි, මෙම චක්‍රලේඛ උපදෙස් හා වෙනත් අදාළ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතු අතර, සම්මත මිල ගණන්ද සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීම අත්‍යවශ්‍යවේ.

**08.පරිපාලන වියදම් වෙන් කිරීම**

මෙම වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුව මගින් දරනු ලබන වියදමින් 1% ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටද, 0.3% ක් දිස්ත්‍රික් කාර්යාලයටද බෙදී යන පරිදි පරිපාලන වියදම් වෙන්කර ගැනීමට හැකියාව පවතී.

**09.අධීක්ෂණය, මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය**

i. ගම්මානය සඳහා සකස් කරන ලද නිෂ්පාදන සැලැස්ම හා තනි පුද්ගල ව්‍යාපෘති නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව අදාල නිළධාරින් මසකට වරක් රැස්වී ප්‍රගතිය සමාලෝචනය කල යුතුය.

ii. මූලස්ථාන කළමනාකරු, අදාල සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමනාකරු.ව්‍යාපෘති කළමනාකරු, සංවර්ධන නිලධාරි (අලෙවි), සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු, ව්‍යාපෘති සහකාර සමගින් අදාළ වසම් භාරව රාජකාරි කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ නිරන්තර අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය.

iii. ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින්ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගි කරවා ගත යුතු අතර, සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් සකස් කල යුතුය.

iv. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී මෙම වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කල යුතුය.

v. ව්‍යාපෘති ආරම්භ කළ පසුව, ඇමුණුම් අංක 06 සහ 07 මගින් ප්‍රගතිය ලබාදීමටත්, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි වන පරිදි ප්‍රගතිය යාවත්කාලීන කර තබාගැනීමටත් කටයුතු කල යුතු වේ.

vi. ව්‍යාපෘතිලාභීන් වෙත ලබාදෙන යෙදවුම් (ප්‍රාග්ධන භාණ්ඩ, සතුන්, රෝපණ ද්‍රව්‍ය හා වෙනත්) පිළිබඳව සවිස්තරාත්මක ලේඛණයක් අදාල සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ සහය ඇතිව ව්‍යාපෘති කළමනාකරු විසින් පවත්වාගත යුතුය.

මෙම චක්‍රලේඛ පිළිබඳ වැඩිදුර විස්තර ජීවනෝපාය සංවර්ධන අංශයේ දුරකථන අංක 0112-873801 හා jeevonopaya@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් හෝ අලෙවි සංවර්ධන අංශයේ දුරකථන අංක 011-2187547 හා samurdhimarketing@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ලබා ගත හැකි බව කාරුණිකව දන්වන අතර, 2024 වර්ෂයේදී මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
03. සභාපති, ජාතික සමෘද්ධි සමාජ සංවර්ධන අරමුදල - සියළුම ප්‍රාදේශීය සංවිධාන සභාපතිවරුන් දැනුවත් කිරීම සඳහා
04. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
06. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.